# දළ දේශීය නිෂ්පාදිතය

## 2022 වර්ෂයේ තෙවන කාර්තුව - නිෂ්පාදන ප්‍රවේශය

පදනම් වර්ෂය 2015

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ තෙවන කාර්තුව (ජූලි 01 සිට සැප්තැම්බර් 30 දක්වා) සඳහා පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල ගණන් (2015) යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කොට නිකුත් කර ඇත.

ඒ අනුව 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ ඇස්තමේන්තු ගත දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 6,417,031ක් සහ ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 2,884,018ක් ලෙස වාර්තා වේ. 2021 වර්ෂයේ තෙවන කාර්තුව සඳහා මෙම වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 4,418,108ක් සහ රුපියල් මිලියන 3,269,510 ක් වශයෙන් වාර්තා වී තිබුණි.

- 2022 වර්ෂයේ තෙවන කාර්තුවේදී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 11.8 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇති අතර පෙර වර්ෂයේ තෙවන කාර්තුවේදී මෙම වර්ධනය සටහන් වුයේ සියයට 5.8 ක සෘණ වර්ධනයක් වශයෙනි.
- 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 8.7ක්, සියයට 21.2ක් සහ සියයට 2.6ක් වශයෙන් පසුබැසීම් වාර්තා කර ඇත. .
- 2022 වර්ෂයේ තෙවන කාර්තුවෙදළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු, සේවා ආර්ථික කටයුතු සහ භාණ්ඩ හා සේවා මත අයකෙරෙන සහනාධාර අඩුකළ බදු පිළිවෙලින් සියයට 8.7ක්, සියයට 34.5 ක්, සියයට 54.1ක් සහ සියයට2.7 ක් වශයෙන් දායකත්වය ලබා දී ඇත.

**අන්තර්ගතය**

2022 තෙවන කාර්තුවේ ආර්ථිකයේ සාමාන්‍ය හැසිරීම - පිටුව 2
කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 4
කර්මාන්ත ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 6
සේවා ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 8

**Source Publication**

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP2015

## 1.0 2022 වර්ෂයේ තෙවන කාර්තුව සඳහා සමස්ත ආර්ථිකයේ හැසිරීම

2022 වර්ෂයේ තෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 11.8 ක පසුබෑසීමක් වාර්තා කර ඇති බවයි.

ඒ අනුව, 2021 වර්ෂයේ තෙවන කාර්තුවේ ස්ථාවර මිල (2015) ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 3,269,510 ක් ලෙස වාර්තා වී තිබූ අතර එය 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 2,884,018ක් දක්වා අඩු වී ඇත.

තව ද, පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය 2021 වර්ෂයේ තෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 4,418,108 ක් ලෙස වාර්තා වූ අතර එය 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 6,417,031 ක් දක්වා සියයට 45.2 කින් වැඩිවී ඇත.

රූපසටහන 01
ප්‍රධාන ආර්ථික කටයුතුවල වර්ධනය - තෙවන කාර්තුව ( 2021 සහ 2022)




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථිකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා ආර්ථික කටයුතු 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 8.7 ක්, සියයට 34.5 ක්, සියයට 54.1 ක් වශයෙන් වේ. තවද භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු(සහනාධාර අඩුකළ) 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 2.7 ක් ලෙස වාර්තා වේ.

2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත කටයුතු සහ සේවා ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 8.7ක්, සියයට 21.2ක් සහ සියයට 2.6ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය ඇස්තමේන්තු කෙරෙන්නේ ඊට පෙර වර්ෂයේ එනම් 2021 වර්ෂයේ තෙවන කාර්තුවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමට සාපේක්ෂව යි. 2021 වර්ෂයේ තෙවන කාර්තුව කෝවිඩ් වසංගතය පාලනය කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් බලපෑමට ලක්වී පැවති කාර්තුවක් විය.

කෙසේ වෙතත් 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය කෙරෙහි කෝවිඩ් වසංගතය හේතුවෙන් බලපෑම් එල්ල වූ තත්ත්වයක් නොපැවති නමුත් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය අඩපණ කරන බලපෑම් රාශියක් ආර්ථිකය තුළ ක්‍රියාත්මක වීම දැකගත හැකි විය. ඒවා අතුරෙන් ඉහළ උද්ධමනය, තෙවන කාර්තුවේ මුල් භාගයේ දී බලශක්ති ක්ෂේත්‍රයේ පැවති අර්බුදකාරී තත්ත්වය, ඉහළ පොලී අනුපාතික, බෝහෝ නිෂ්පාදන කර්මාන්ත කටයුතු සඳහා අවශ්‍ය යෙදවුම් හිගවීම සහ ඉහළ යෙදවුම් මිල ගණන්, සිමෙන්ති හිගය සහ ඉහළ ඉදිකිරීම් අමුද්‍රව්‍ය මිල ගණන්, පොහොර සහ කෘෂිරසායන ක්ෂේත්‍රයේ පැවති ගැටලු, අධික ලෙස ඉහළ ගිය ප්‍රවාහන වියදම් සහ භාණ්ඩ බෙදාහැරීමේ දුෂ්කරතා සහ ආදායමේ මූර්ත

වටිනාකම් අඩුවීමෙන් අත්‍යවශ්‍ය සහ අත්‍යවශ්‍ය නොවන බොහෝ භාණ්ඩ හා සේවා සඳහා සාමාන්‍ය ජනතාවගේ ඉල්ලුම අඩුවීම යනාදිය ආර්ථිකයේ පසුබෑසීම කෙරෙහි විශාල බලපෑමක් කළ හේතූන් වශයෙන් හඳුනාගත හැකි ය.

මෙකී බලපෑම් හේතුවෙන් 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී ඉදිකිරීම් කර්මාන්තය, පතල් හා කැනීම් කර්මාන්තය, මූල්‍ය සේවා සැපයීම්, රක්ෂණ සේවා සැපයීම, සමස්ත නිෂ්පාදන කර්මාන්ත කටයුතු, සත්ව පාලන කටයුතු, වී වගා කිරීම, ධාන්‍ය වගා කිරීම, එළවළු වගා කිරීම, කරදිය ධීවර කටයුතු විශාල අගයන්ගෙන් පසුබෑසීම් වාර්තා කර තිබීම දැකගත හැකි ය.

2021 වර්ෂයේ තෙවන කාර්තුවේ දී වාර්තා වූ සියයට 2.8 ක පසුබෑසීමක් වාර්තා කර තිබූ කෘෂිකාර්මික අංශයේ ආර්ථික කටයුතු 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සමස්තයක් වශයෙන් සියයට 8.7 ක පසුබෑසීමක් වාර්තා කර ඇත. කෘෂිකාර්මික කටයුතුවල වාර්තා වී ඇති මෙම පසුබෑසීම තුළ ‘කරදිය ධීවර කටයුතු’ (සියයට 33.5), 'ධාන්‍ය වගා කිරීම' (සියයට 26.1), 'වී වගා කිරීම' (සියයට 19.8), ‘සත්ව නිෂ්පාදනය’ (සියයට 19.5), ‘තේ වගා කිරීම' (සියයට 18.9), 'එළවළු වගා කිරීම' (සියයට 9.4), 'පළතුරු වගා කිරීම' (සියයට 6.0), ‘රබර් වගා කිරීම' (සියයට 3.5) වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් මෙම කාර්තුවේ දී 'පැළ බෝකිරීම' (සියයට 39.8) ‘මිරිදිය ධීවර කටයුතු (සියයට 26.3), වන වගා සහ දැව කඳන් නිෂ්පාදනය’ (සියයට 24.6), ‘පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව’ (සියයට 6.0) සහ 'කුළු බඩු වගා කිරීම' (සියයට 4.7) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

පසුගිය වර්ෂයේ තෙවන කාර්තුවේ දී සියයට 2.0ක පසුබෑසීමක් වාර්තා කර තිබූ කර්මාන්ත ආර්ථික කටයුතු 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී ද සියයට 21.1ක පසුබෑසීමක් වාර්තා කර ඇත. එහිදී 'ඉදිකිරීම් කර්මාන්තය' සහ 'පතල් හා කැනීම් කර්මාන්තය' පිළිවෙලින් සියයට 33.2ක් සහ සියයට 45.9ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. තව ද නිමැවුම් කර්මාන්ත කටයුතු සමස්තයක් වශයෙන් සියයට 14.8 ක පසුබෑසීමක් වාර්තා කර ඇති අතර ඒ තුළ 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන කර්මාන්තය' (සියයට 56.3), 'වෙනත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 42.2),‘මූලික ලෝහ සහ ව්‍යුහාත්මක ලෝහ නිෂ්පාදනය' (සියයට 42.1), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 37.9), ‘රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 32.4), ‘යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය’ (සියයට 21.3), ‘ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය’(සියයට 20.5), ‘රසායනික ද්‍රව්‍ය හා මූලික ඖෂධ වර්ග නිෂ්පාදනය’ (සියයට 11.9), 'දැව හා දැව ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 9.3) සහ 'කඩදාසි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනය' (සියයට 1.6) ක් වශයෙන් පසුබෑසීම් වාර්තා කර ඇත.

කෙසේ වෙතත් ප්‍රධාන නිමැවුම් කර්මාන්තයක් වන 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු' මෙම කාර්තුවේ දී සියයට 9.3ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී කර්මාන්ත අංශයේ ආර්ථික කටයුතු අතුරෙන් ‘විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම’ සහ ‘ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම’ පිළිවෙලින් සියයට 3.8 ක් සහ සියයට 16.7 ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 2.6ක පසුබෑසීමක් වාර්තා කර ඇති අතර එහිදී 'රක්ෂණ සේවා' සහ 'මූල්‍ය සේවා' පිළිවෙලින් සියයට 32.8ක් සහ සියයට 31.1ක් වශයෙන් පසුබෑසීම් වාර්තා කර ඇත. තව ද 'වැඩසටහන් සම්පාදනය සහ ගුවන්විදුලි හා රූපවාහිනී විකාශන කාර්යයන්'(සියයට 8.8), 'වෘත්තීය සේවා'(සියයට 7.0), 'සෞඛ්‍ය සේවා' (සියයට 6.6), 'දේපොළ වෙළඳාම් කටයුතු සහ නිවාස අයිතිය' (සියයට 4.8), 'තොග හා සිල්ලර වෙළඳාම' (සියයට 2.3) යන ආර්ථික කටයුතු ද මෙම කාර්තුවේ දී සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. මේ අතර විශේෂයෙන් 'තොරතුරු තාක්ෂණ සේවා සැපයීමේ කටයුතු' තවදුරටත් සියයට 4.7 ක පසුබෑසීමක් 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත.

මේ අතර සේවා ආර්ථික කටයුතු අතුරෙන් ‘නවාතැන් හා ආහාර පාන සැපයීම’ (සියයට 39.3), 'තැපැල් හා කුරියර් සේවා' (සියයට 6.8), 'භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සහ ගබඩාකරණ කටයුතු' (සියයට 6.0) 'අධ්‍යාපනය' (සියයට 3.9), 'විදුලි සංදේශ සේවා' (සියයට 3.3) සහ 'අනෙකුත් පෞද්ගලික සේවා' (සියයට 1.4) වශයෙන් ධන වර්ධන වේගයන් 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත.

කිසියම් වර්ෂයක ස්ථාවර මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය හා පවත්නා මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකය වේ. එහි අගය 2021 වර්ෂයේ තෙවන කාර්තුවේ දී 135.1ක් (2015=100) ලෙස වාර්තා වන අතර 2022වර්ෂයේ තෙවන කාර්තුවේ දී 222.5ක් ලෙස වාර්තා විය. ඒ අනුව දළ දේශය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකයට අනුව 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 64.66කි.

ජාතික පාරිභෝගික මිල දර්ශකය ( NCPI ) (2013=100) 2021 වර්ෂයේ තෙවන කාර්තුවේ දී 147.1ක් ලෙස වාර්තා වී ඇති අතර එය 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී 250.3ක් ලෙස වාර්තා විය. ඒ අනුව 2021 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 70.2කි.

## 1.1 කෘෂිකාර්මික ආර්ථික කටයුතු

2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සමස්තයක් ලෙස කෘෂිකාර්මික ආර්ථික කටයුතු, 2021 වර්ෂයේ තෙවන කාර්තුවේ වාර්තා වූ සියයට 2.8ක ඍණාත්මක වර්ධනය හා සසඳන විට සියයට 8.7ක මන්දගාමී වර්ධනයක් වාර්තා කර ඇත. කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 559,371ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 216,128 ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 8.7ක පමණ දායකත්වයක් ලබාදී ඇති අතර ස්ථාවර මිල ගණන් යටතේ එම දායකත්වය සියයට 7.5 කි.

රූපසටහන 02
කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය - තෙවන කාර්තුව 2022




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

“ධාන්‍ය වගා කිරීම (වී හැර)” උප ආර්ථික කටයුත්ත 2021 තෙවන කාර්තුවේ දී වාර්තා වූ සියයට 2.2 ක වර්ධනයට සාපේක්ෂව 2022 තෙවන කාර්තුව තුළ දී සියයට 26.1 ක පසුබැසීමක් වාර්තා කර ඇත. බඩ ඉරිඟු, මුං, තල, රට කජු නිෂ්පාදනයන් පිළිවෙලින් සියයට 69.6, සියයට 55.7, සියයට 26.1, සියයට 27.3 කින් පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත.

“වී වගා කිරීම” උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2021 තෙවන කාර්තුව සමඟ සැසඳීමේ දී 2022 තෙවන කාර්තුවේ දී සියයට 19.8 ක පසුබැස්මක් වාර්තා කර ඇති අතර දළ දේශීය නිෂ්පාදනය සඳහා එකතු කළ අගය ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 17,797 ක් ලෙස වාර්තාවේ.

කිසියම් වර්ෂයක තෙවන කාර්තුවේ දී “එළවළු වගා කිරීම” ආර්ථික කටයුත්ත සඳහා දළ එකතු කළ අගය ගණනය කිරීමේ දී එම වර්ෂයේ යල කන්නයේ දී වගා කළ බිම් ප්‍රමාණය සහ අස්වැන්න පිළිබඳ තොරතුරු පදනම් කර ගනී. ඒ අනුව 2022 වර්ෂයේ තෙවන කාර්තුව සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කර ඇති වගා කළ බිම් ප්‍රමාණය සහ අපේක්ෂිත අස්වැන්න පිළිබඳ තොරතුරු පදනම් කර ගනිමින් ඇස්තමේන්තු සකස් කර ඇති අතර එහිදී බොහෝ එළවලු වර්ග

සම්බන්ධයෙන් වගා කළ බිම් ප්‍රමාණයේ අඩුවීමක් නිරීක්ෂණය කර ඇති අතර අපේක්ෂිත අස්වැන්නේ සැලකිය යුතු අඩුවීමක් ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව තෙවන කාර්තුවේ දී එළවලු වගා කිරීම ආර්ථික කටයුත්ත සියයට 9.4 ක පසුබෑසීමක් වාර්තා කර ඇති අතර විශේෂයෙන් සෑම එළවලු වර්ගයක් සඳහා ම පාහේ නිෂ්පාදකයාගේ මිල ගණන් ශීඝ්‍ර විශාල වැඩිවීමක් වාර්තා වී ඇත.

"තෙල් සහිත පලතුරු වගාව" යන ආර්ථික ක්‍රියාකාරකම ප්‍රධාන වශයෙන් පොල් වගාව, තැඹිලි වගාව හා කටුපොල් වගාව යන ආර්ථික ක්‍රියාකාරකම් වලින් සමන්විත වන අතර පොල් වගා කිරීම ඉන් ප්‍රධාන වේ. "තෙල් සහිත පලතුරු වගාව" යන උප ආර්ථික ක්‍රියාකාරකම 2022 වර්ෂයේ තෙවන කාර්තුව තුළදී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 28,345ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 0.7ක දායකත්වයක් ලබාදී ඇත. පොල් වගාකරන ප්‍රදේශ වල පැවති හිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේදී පොල් ගෙඩි නිෂ්පාදනය සියයට 6කින් පමණ ඉහල ගොස් ඇත. එමෙන්ම 2021 තෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළ පොල් ගෙඩි අපනයනය සියයට 35කින් පමණ සැලකියයුතු ලෙස අඩු වී ඇති අතර තැඹිලි අපනයනය ද සියයට 6කින් අඩු වී ඇත. 2022 වර්ෂයේ තෙවන කාර්තුවේදී "තෙල් සහිත පළතුරු වගා කිරීම" යන සමස්ත ආර්ථික කටයුත්ත සියයට 6.0ක වර්ධනයක් වාර්තා කර ඇත.

"තේ වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2022 තෙවන කාර්තුවේ දී සියයට 18.9 ක පසුබෑස්මක් වාර්තා කර ඇති අතර පසුගිය වසරේ තෙවන කාර්තුවේ දී සියයට 3.9 ක වර්ධනයක් වාර්තා කර ඇත. 2022 තෙවන කාර්තුවේ දී "නිමි තේ" නිෂ්පාදන ප්‍රමාණයෙහි සියයට 18.9 ක පසුබෑස්මක් වාර්තා කර ඇත. කොළඹ වෙළඳපොළෙහි නිමි තේ කිලෝවක සාමාන්‍ය මිළ, පසුගිය වසරේ මෙම කාර්තුව හා සැසඳීමේ දී රු. 588.76 සිට රු. 1,038.48 දක්වා සියයට 76.4 ක වර්ධනයක් වාර්තාවී වී ඇත. තේ නිෂ්පාදනය සඳහා සියයට 64.3 ක වැඩිම දායකත්වයක් ලබාදෙන පහතරට තේ නිෂ්පාදනය සියයට 16.4 ක පසුබෑස්මක් මෙම කාර්තුවේ දී වාර්තා කර ඇත.

"රබර් වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතුකළ අගය සියයට 3.5 ක පසුබෑස්මක් ද රබර් නිෂ්පාදන ප්‍රමාණයේ සියයට 2.5 ක පසුබෑස්මක් ද 2022 තෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත. 2021 තෙවන කාර්තුවේදී "රබර් වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතුකළ අගය සියයට 2.3 ක වර්ධනයක් හා රබර් නිෂ්පාදන ප්‍රමාණයේ සියයට 8.0 ක පසුබෑස්මක් ද වාර්තාවී ඇත. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 තෙවන කාර්තුවේ තොරතුරු වලට අනුව, සකස් කළ රබර් කිලෝග්‍රැමයක් සඳහා අවශ්‍ය ලේටෙක්ස් ප්‍රමාණයෙහි සාමාන්‍ය මිළ රු. 607.21 සිට රු. 837.44 දක්වා සියයට 37.9 කින් වර්ධනය වී ඇත.

"අනෙකුත් ස්ථාවර බෝග වගා කිරීම" උප ආර්ථික කටයුත්ත පුවක් වගා කිරීම, බුලත් වගා කිරීම, කොස් වගා කිරීම, දෙල් වගා කිරීම සහ රා මැදීම යන ආර්ථික ක්‍රියාකාරකම්වල එකතුවෙන් සමන්විත වේ. 2022 වර්ෂයේ තෙවන කාර්තුවේදී මෙම සමස්ත ආර්ථික කටයුත්ත ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 7116 ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 2.6ක වර්ධනයක් වාර්තා කර ඇත.

'සත්ත්ව නිෂ්පාදනය'යන ආර්ථික කටයුත්ත කිරි නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය හා මස් පිණිස සතුන් ඇති කිරීම යනාදියෙන් සමන්විත වේ. මෙම ආර්ථික ක්‍රියාකාරකම 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 20,893ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 1.2ක දායකත්වයක් ලබාදී ඇත. මෙම කාර්තුව තුළ දී සත්ව නිෂ්පාදන ක්‍රියාකාරකම 2021 වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 19.5ක සැලකිය යුතු පසුබෑස්මක් වාර්තා කර ඇත. සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්වේ දත්ත වලට අනුව මෙම කාර්තුව තුළදී මස් පිණිස කුකුළන් ඇති කිරීම සියයට 14.3ක,බිත්තර නිෂ්පාදනය සියයට 34.6 ක හා කිරි නිෂ්පාදනය සියයට 14.4කින් සැලකිය යුතු ලෙස අඩු වී ඇත. එමෙන්ම 2021 තෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළදී මස් පිණිස ඇති කරන සියලුම සතුන්ගේ (ගවයන්, එළුවන්, ඌරන් සහ කුකුළන්) මිල, දියර කිරි ලීටරයක මිල, බිත්තර සඳහා මිල යන නිෂ්පාදකයාගේ මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

"පැළ හා බීජ ප්‍රවර්ධනය" යන ආර්ථික ක්‍රියාකාරකම සඳහා ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ රට තුළ පොල්, තේ, රබර්, කුරුඳු, ගම්මිරිස්, මල් හා පලතුරු යන පැළ වර්ග නිෂ්පාදනය කිරීමයි. 2021 තෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුළදී ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 325ක වටිනාකමක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 39.8 ක සැලකියයුතු වර්ධනයක් වාර්තා කර ඇත. මෙහිදී බෝහෝ පැළ වර්ග නිෂ්පාදනය සැලකිය යුතු ප්‍රමාණයකින් වර්ධනය වීම මෙයට හේතු වී ඇත.

කෘෂි සහායක කාර්යයන් යන ආර්ථික ක්‍රියාකාරකම සඳහා වී වගාවේදී, කුඹුරු බිම් සකස් කිරීමට හා අස්වනු නෙලීමේදී පිලිවෙලින් රෝද හතරේ හා රෝද දෙකේ ට්‍රැක්ටර් මෙන්ම ඒකාබද්ධ අස්වනු නෙලීමේ යන්ත්‍ර (Combined Harvestor) යොදා ගනු ලබයි. එම සේවය ලබා දීම තුලින් ආර්ථිකයට ජනනය වන ආර්ථික විටිනාකම මෙහිදී සලකනු ලබනයි. එය

මෙම ආර්ථික කටයුත්තෙහි ප්‍රධාන සංරචකයි. ඊට අමතරව ධාන්‍ය වගා භෝග කිහිපයක් හා එලවළු භෝග කිහිපයක් සඳහා එලෙස පස සකස් කිරීමට යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීමේ පිරිවැය ඔස්සේ ඒ සඳහා වන යාන්ත්‍රික සහායක සේවා සැපයුම මීට එකතු කරනු ලබයි. මේ අනුව 2022 තෙවෙනි කාර්තුවේදී, වී වගා බිම් ප්‍රමාණයේ පහත වැටීම හේතුවෙන් සියයට 2.9 ක පසුබෑසීමක් පෙන්නුම් කොට ඇත. එහෙත් නාමික වටිනාකම (Nominal terms) සියයට 38.6 ක ඉහළ යාමක් පෙන්නුම් කරයි. ඉන්ධන මිළ ඉහළ යාම හේතුවෙන් හා combined harvestor හි යාන්ත්‍රික යෙදවුම් වල මිළ ගනන් ඉහළ යාම නිසා මෙම සේවා ගාස්තු ඉහළ යාම මීට හේතුවිය.

"වන සම්පත් හා දැව කඳන් නිෂ්පාදනය" යන උප කෘෂිකාර්මික ආර්ථික කටයුත්ත තුල ප්‍රධාන දායකත්වය නියෝජනය වන්නේ දර නිෂ්පාදනය හා දැව කඳන් නිෂ්පාදනය තුලින් ජනනය වන වටිනාකම විසිනි. LP ගෑස් භාවිතයේ යම් අඩු වීමක් මෙම කාර්තුව තුලදීද අත්දකින්න ලැබෙන බැවින් රටේ දර පරිභෝජනය ඉහළ ගොස් ඇත. ඒ හේතුවෙන් එම නිමැවුම් වටිනාකම ඉහළ ගොස් ඇත. ඊට අමතරව මෙම කාර්තුව තුල දැව කඳන් නිෂ්පාදනය ඉහළ යාමක්ද වාර්ථා වී ඇත. ඒ අනුව සමස්තයක් වශයෙන්, ස්ථාවර මිළ ගනන් අනුව මෙම ආර්ථික කටයුත්තෙහි සියයට 24.6 ක සැලකිය යුතු වර්ධනයක් මෙම කාර්තුව සඳහා ඇස්තමේන්තු කොට ඇත. පසුගිය වසරේ තෙවෙනි කාර්තුවේදී මෙම ආර්ථික කටයුත්ත තුල සියයට 19.0 ක පසුබෑසීමක් පෙන්නුම් කොට තිබුනි. එම සැලකිය යුතු පසුබෑසීමද, (එම පහළ මට්ටමේ සිට සාමාන්‍ය මට්ටමට මෙවර නිමැවුම එලැඹීමද) මෙම කාර්තුවේ ඉහළ වර්ධනයට පසුබිම් හේතුවක් විය.

2021 තෙවන කාර්තුවට සාපේක්ෂව 2022 තෙවන කාර්තුවේදී කරදිය මත්ස්‍ය නිෂ්පාදනය ආර්ථික කටයුත්ත එකතුකළ අගය සියයට 33.5 කින් පහළ ගොස් ඇත. 2022 තෙවන කාර්තුවේදී මෙම ආර්ථික කටයුත්තෙහි, වර්තමාන මිළ අනුව එකතුකළ වටිනාකම රුපියල් මිලියන 55,821ක් වන අතර එය දළ ජාතික නිෂ්පාදිතයට සියයට 0.6 ක දායකත්වයක් ලබා දී ඇත. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තා වලට අනුව 2022 තෙවන කාර්තුවේදී, පෙර වසරේ තෙවන කාර්තුවට සාපේක්ෂව කරදිය මත්ස්‍ය නිෂ්පාදනය සියට 33.4 කින් පහළ යාමක් පෙන්නුම් කරයි.

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය හා ජලජීවී වගාව ආර්ථික කටයුත්තෙහි එකතුකළ වටිනාකම 2021 තෙවන කාර්තුවට සාපේක්ෂව 2022 තෙවන කාර්තුවේදී සියයට26.3 ක වර්ධනයක් වාර්තා කර ඇත.

## 1.2 කර්මාන්ත ආර්ථික කටයුතු

2021 වසරේ තෙවන කාර්තුවට සාපේක්ෂව 2022 වසරේ තෙවන කාර්තුවේ දී සමස්ත කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 21.2ක සෘණ වර්ධන වේගයක් වාර්තා කර ඇත. කර්මාන්ත ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 2,215,100 ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 816,932 ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 34.5ක පමණ දායකත්වයක් ලබාදී ඇති අතර ස්ථාවර මිල ගණන් යටතේ එම දායකත්වය සියයට 28.3 කි.

"පතල් හා කැනීම්" කර්මාන්තය, 2022 වර්ෂයේ තෙවන කාර්තුවේදී සියයට 45.9 ක සැළකිය යුතු පසුබෑසීමක් වාර්තා කර ඇත. පතල් හා කැනීම් ආර්ථික කටයුත්ත ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම්, මැණික් කැනීම් හා අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය කැනීම් වශයෙන් කාණ්ඩ තුනක් යටතේ වෙන් වෙන්ව හඳුනාගත හැකි ය. සමස්ත පතල් හා කැනීම් ආර්ථික කටයුත්තේ දළ එකතුකළ වටිනාකමෙන් සියයට 82.7ක පමණ ප්‍රමාණයක් ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම් මගින් ලබා දෙන අතර එය 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දි සියයට 50.3 ක පහළ යාමක් වාර්තා කර ඇත. තව ද අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය කැනීම් සියයට 10.2ක පහළ යාමක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් මැණික් කැනීම් සියයට 28.2ක ධන වර්ධනයක් වාර්තා කර තිබුණද ඉහළ දායකත්වයක් සපයන ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම් සම්බන්ධයෙන් වාර්තා වී ඇති සෘණ වර්ධනය මෙම ආර්ථික කටයුත්තේ සමස්තයක් වශයෙන් පසුබෑසීමක් වාර්තා වීමට බලපා ඇත.

රූපසටහන 03

### කාර්මික ආර්ථික කටයුතුවල වර්ධනය - තෙවන කාර්තුව 2022




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

විදුලිය නිෂ්පාදනය" කර්මාන්තයෙහි ස්ථාවර මිල ගණන් යටතේ දළ එකතු කළ අගය 2022 වර්ෂයේ තෙවන කාර්තුවේදී සියයට 3.8ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. එහි දි ඉන්ධන යොදාගනිමින් තාප විදුලි බලාගාර මගින් සිදුකරන විදුලිය නිෂ්පාදනය මෙම කාර්තුවේ දී සියයට 21කින් පමණ සැළකිය යුතු ලෙස අඩුවී ඇති අතර පුනර්ජනනීය විදුලිය නිෂ්පාදනය සියයට 7.5කින් අඩුවී ඇත. කෙසේ වෙතත් ජල විදුලි බලාගාර විදුලිය නිෂ්පාදනය සියයට 8ක පමණ වැඩිවීමක් වාර්තා වන අතර ජල විදුලිය නිෂ්පාදනයේ දී ඒකක පිරිවැය අඩු බැවින් සාපේක්ෂව වැඩි එකතුකළ අගයක් ඒ තුළින් ජනනය වේ. මෙම කාර්තුවේ දී විදුලිය නිෂ්පාදනය ආර්ථික කටයුත්තේ ධන වර්ධනයක් වාර්තා වීමට බලපා ඇත්තේ අනෙකුත් මාර්ග වලට වඩා ජල විදුලිය නිෂ්පාදනය වැඩියෙන් සිදු වීමයි. කෙසේ වෙතත් ඉන්ධන මිල ගණන්වල සිදුවූ විශාල වැඩි වීම නිසා පවත්නා මිල ගණන් යටතේ මෙම ආර්ථික කටයුත්තේ සියයට 59.7ක පමණ විශාල වැඩිවීමක් වාර්තා වී ඇත. තව ද 36:44:20 ක් ලෙස 2021 වර්ෂයේ තෙවන කාර්තුවේ දී වාර්තා වූ ජල විදුලිය, තාප විදුලිය සහ පුනර්ජනනීය විදුලිය අතර අනුපාතය 42:37:20 ක් ලෙස මෙම කාර්තුවේ දී වෙනස් වී ඇත.

2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී "ජලය එක්රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම" යන උප ආර්ථික කටයුත්ත සියයට 16.7ක වර්ධනයක් වාර්තා කර ඇත. එහිදී පිරිසිදු කරන ලද ජල ප්‍රමාණය පෙර වර්ෂයේ දෙවන තෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 1.7ක පමණ අඩුවීමක් පෙන්නුම් කරන අතර නිෂ්පාදකයාගේ මිල ගණන්වල සිදුවූ වැඩිවීම නිසා නිමැවුමේ වටිනාකම සියයට 35.0කින් පමණ වැඩිවී ඇත. මෙහි යෙදවුම් පිරිවැයෙන් සැලකිය යුතු කොටසක් විදුලිය සඳහා යන වියදමෙන් සමන්විත වන අතර මෙම කාර්තුවේ දී විදුලිය මිල ගණන් පෙන්නුම් කරන දර්ශකය සියයට 27.0කින් පමණ වැඩිවී ඇති අතර නිමැවුමේ මිල පෙන්නුම් කරන දර්ශකය සියයට 38.0 කින් පමණ වැඩිවී ඇත. ඒ අනුව යෙදවුම් මිල ගණන් වැඩි වීමට වඩා වැඩියෙන් නිමැවුම් මිල ගණන් වැඩි වීම මෙම ආර්ථික කටයුත්තේ දළ එකතුකළ අගය ධන වර්ධනයක් වාර්තා වීමට බලපා ඇත.

2021 තෙවන කාර්තුව හා සසඳන විට 2022 තෙවන කාර්තුවේදී 'ඉදිකිරීම්' ක්‍රියාකාරකම් සියයට 33.2 කින් අඩු වී ඇත. මෙම කාර්තුවේ දී දළ දේශීය නිෂ්පාදිතයේ ඉදිකිරීම් කටයුතුවල කොටස සියයට 7.2 ක් ලෙස වාර්තා වී ඇත. එමෙන්ම 2022 තෙවන කාර්තුව තුළ සමස්ත සිමෙන්ති සැපයුම සියයට 50.2 කින් පහත වැටී ඇති අතර සිමෙන්ති ඇතුළු සියලු ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉහළ යාම මෙම සෘණ වර්ධනයට හේතු වී තිබේ.

### 1.2.1 නිමැවුම කර්මාන්ත කටයුතු

2022 තුන්වන කාර්තුවේ නිෂ්පාදන ක්‍රියාකාරකම් කෙරෙහි පවතින ආර්ථික අර්බුදය දැඩි ලෙස බලපා ඇත. කෙසේ වෙතත්, 2021 තුන්වන කාර්තුව හා සංසන්දනය කර බලනවිට 2022 තුන්වන කාර්තුවේ දී සමස්ත නිෂ්පාදන කර්මාන්ත ක්‍රියාකාරකම් මගින් 14.8 හි සැලකිය යුතු හැකිලීමක් පෙන්නුම් කර ඇති අතර, 2022 තුන්වන කාර්තුවේ මුළු දළ දේශීය නිෂ්පාදිතයට වර්තන මිළ අනුව එකතු කල අගය රුපියල් මිලියන 522, 570 කි. 2021 තුන්වන කාර්තුවට සාපේක්ෂව 2022 තුන්වන කාර්තුවේ, ඉන්ධන හිඟය, විදුලිය ඇනහිටීම්, ගෝලීය වශයෙන් සහ දේශීය වශයෙන් ආනයනය කරන ලද ප්‍රධාන අමුද්‍රව්‍යවල පුලුල් හිඟය සහ මිළ අධික විම නිසා ඇති වූ බලපෑම හේතුවෙන් නිෂ්පාදන ක්‍රියාකාරකම් බොහොමයක් හැකිලීම් වාර්තා කර ඇත.

නිෂ්පාදන ක්‍රියාකාරකම් අතරින් විශාලතම උපක්‍රියාකාරකම වන 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන නිෂ්පාදනය' යන උපක්‍රියාකාරකම සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට සියයට 7.9 ක දායකත්වයක් ලබා දී ඇති අතර 2021 තුන්වන කාර්තුව හා සසදන වීට එය සියයට 20.5 කින් හැකිලී ඇත. රෙදිපිළි නිෂ්පාදනය, ඇඟලුම් සහ සම් නිෂ්පාදනය නිෂ්පාදන ක්‍රියාකාරකම් අතරින් දෙවන විශාලතම උපක්‍රියාකාරකම වන අතර, එම ක්‍රියාකාරකම 2021 තුන්වන කාර්තුවේදී 5.3 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කර ඇති අතර , 2022 තුන්වන කාර්තුවේ  දී සියයට 9.3 ක කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි.

අඟුරු සහ  ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන උප ක්‍රියාකාරකම් 2021 තුන්වන කාර්තුවේදී සියයට 25.6 ක හැකිලීමක් වාර්තා කර ඇති අතර 2022 තුන්වන කාර්තුවේදී තව දුරටත්  සියයට 56.3 ක ඉහළම හැකිලීමක් වාර්තා කර ඇත. මෙම ඉහළ හැකිලීමට  හේතුවී ඇත්තේ ශ්‍රිලංකාවේ පවතින මුල්‍ය අර්බුදය හේතුවෙන් බොර තෙල් ආනයනය සිමා වීම හේතුවෙන් තෙල් පිරිපහදු කටයුතු ක්‍රියාත්මක නොවීමයි   .

2021 තුන්වන කාර්තුව හා සසඳන විට 2022 තුන්වන කාර්තුවේ අනෙකුත් සියලුම නිෂ්පාදන ක්‍රියාකාරකම් කටයුතු සලකා බලන විට, වර්ධනයේ හැකිලීම් තත්ත්වයන් වාර්තා වේ. මෙම ක්‍රියාකාරකම් හි වර්ධනයෙහි හැකිලීමේ ප්‍රතිශත පහත පරිදි වේ. 'අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනය' (සියයට 42.2), මූලික ලෝහ නිෂ්පාදනය සහ නිෂ්පාදනය කරන ලද ලෝහ නිෂ්පාදන' ( සියයට 42.1), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 37.9), 'රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනය' (සියයට 32.4), 'යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය' (සියයට 21.3), 'අනෙකුත් නිෂ්පාදන සහ අළුත්වැඩියා කිරීම් (සියයට 27.2) 'රසායනික නිෂ්පාදනය සහ ඖෂධ නිෂ්පාදන' (සියයට 11.9), 'ගෘහ භාණ්ඩ හැර ලී නිෂ්පාදනය සහ ලී සහ කිරළ නිෂ්පාදනය' (සියයට 9.3) 'කඩදාසි නිෂ්පාදනය, මාධ්‍ය නිෂ්පාදන මුද්‍රණය සහ ප්‍රතිනිෂ්පාදනය' (සියයට1.6).

## 1.3 සේවා ආර්ථික කටයුතු

2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 2.6ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. සේවා ආර්ථික කටයුතුවල එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 3,468,703ක් ලෙස වාර්තා වන අතර ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 1,795,940 ක් ලෙස වාර්තා වේ. පවත්නා මිල ගණන් යටතේ 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 54.1ක පමණ දායකත්වයක් ලබාදී ඇති අතර ස්ථාවර මිල ගණන් යටතේ එම දායකත්වය සියයට 62.3 කි.

රූපසටහන 04
සේවා ආර්ථික කටයුතුවල වර්ධනය -තෙවන කාර්තුව 2022




මූලාශ්‍රය:
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

“තොග සහ සිල්ලර වෙළඳාම” 2022 තෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 15.3ක පමණ දායකත්වයක් ලබා දී ඇති අතර 2021 තෙවන කාර්තුවේ වාර්තාවූ සියයට 1.2ක සෘණ වර්ධනය හා සැසදීමේදී 2022 තෙවන කාර්තුවේදී ද සියයට 2.3ක සෘණ වර්ධනයක් පෙන්නුම් කරයි.දේශීය කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදනය සහ කාර්මික භාණ්ඩ නිෂ්පාදනයඅඩුවීමත්, ආනයන භාණ්ඩ අඩුවීමත් මෙම සෘණ වර්ධනයට හේතු විය.

“තොග හා සිල්ලර වෙළඳාම” යටතේ ආහාර හා ආහාර නොවන අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වෙළඳාමට අමතරව ඇඳුම්, පාවහන් හා උපාංග, විලාසිතා සහ ආභරණ, විද්‍යුත් උපකරණ, ගෘහ භාණ්ඩ හා දිගුකාලීන පරිභෝජන භාණ්ඩ වෙළෙඳාම යනාදිය ආවරණය කරයි.

භාණ්ඩ ආනයන සහ තොග හා සිල්ලර වෙළෙන්දුන් හරහා පාරිභෝගිකයන් අතට පත්වන දේශීය භාණ්ඩ නිෂ්පාදිතයේ උච්චාවචනයන් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්ත මගින් දළ දේශීය නිෂ්පාදිතයට එකතුකෙරෙන වටිනාකම තීරණය වීමට බලපානු ලැබේ. එබැවින් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්තේ වර්ධන වේගය ආනයන, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ දේශීය කාර්මික නිෂ්පාදනය යන විචල්‍යයන්හී වෙනස්වීම මත රඳා පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ජාත්‍යන්තර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2021 තෙවන කාර්තුව සඳහා සමස්ත ආනයන වියදම රු. මිලියන 988,389 වූ අතර 2022 තෙවන කාර්තුව සඳහා එය රු. මිලියන 1,466,214 දක්වා සියයට 48.3කින් වැඩිවී ඇත. එසේම, මෙම කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2021 වර්ෂයේ තෙවන කාර්තුවේ පැවති රු. මිලියන 196,305 සිට රු. මිලියන 222,840 දක්වා සියයට 13.5කින් වැඩිවී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වෙළඳ දර්ශකවලට අනුව, 2021 තෙවන කාර්තුව හා සසඳන විට 2022 තෙවන කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය සියයට 18.0කින් ද, සමස්ත ආනයන පරිමා දර්ශකය සියයට 28.6කින් ද අඩුවී තිබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ජාත්‍යන්තර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2021 තෙවන කාර්තුව හා සසඳන විට 2022 තෙවන කාර්තුවේදී ලෝකයේ සෙසු රටවල් වෙත යොමු වූ මුළු අපනයන වටිනාකම සියයට 92.6කින් වර්ධනය වී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) වෙළඳ දර්ශකයන්ට අනුව සමස්ත අපනයන පරිමා දර්ශකය සියයට 2.7කින් අඩුවී තිබේ. එහිදී කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශකය සහ කාර්මික අපනයන පරිමා දර්ශකය මෙම කාර්තුවේදී පිළිවෙලින් සියයට 8.7 කින් සහ සියයට 1.4කින් අඩුවී ඇත.

"මගීන් සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම" යන සේවා ආර්ථික කටයුත්ත, භාණ්ඩ හා සේවා ගොඩබිම් ප්‍රවාහනය, මුහුදු මාර්ග වල ප්‍රවාහනය සහ ගුවන් සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම යන උප ආර්ථික කාර්යයන් ගෙන් සමන්විත වේ. 2022 වර්ෂයේ තෙවන කාර්තුවේ දී ගොඩබිම් ප්‍රවාහන කටයුතු ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර පසුගිය වසරේ තෙවන කාර්තුවට සාපේක්ෂව, පොදු මගී ප්‍රවාහන සේවා ධන වර්ධනයක් වාර්තා කිරීම මේ සඳහා බලපා ඇත. මේ අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය දුම්රිය දෙපාර්තමේන්තුව හා ජාතික ගමනාගමන කොමිසම මගින් සකසනු ලබන මගී කිලෝ මීටර් ප්‍රමාණය පිළිවෙලින් සියයට 714.3, 548.9, 184.8 ලෙස වැඩි වී ඇත. මෙම කාර්තුවේ දී ගුවන් ප්‍රවාහනය සහ නාවික ප්‍රවාහනය ධන වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර ගබඩා පහසුකම් සැපයීම සහ අනෙකුත් ප්‍රවාහන සහය සේවා කටයුතු සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. මේ අනුව සමස්තයක් වශයෙන් ප්‍රවාහන කටයුතු 2021 වර්ෂයේ තෙවන කාර්තුවට සාපේක්ෂව 2022 තෙවන කාර්තුවේ දී සියයට 6.0 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

තැපැල් හා කුරියර් සේවා" ආර්ථික කටයුත්ත සැලකීමේදී, 2021 දෙවන කාර්තුවට සාපේක්ෂව 2022 දෙවන කාර්තුවේ සියයට 6.8 ක වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනයට තැපැල් කටයුතු බෙහෙවින් දායක වූ අතර මෙම කාර්තුවේ ආන්තික වර්ධනයක් පවත්වා ගනිමින් කුරියර් කටයුතු ද බෙහෙවින් දායක විය.

"නවාතැන්, ආහාර හා පාන වර්ග සැපයීම" යන ආර්ථික කටයුත්ත 2021 තෙවන කාර්තුවේ වාර්තා කල සියයට 15.8 ක පසුබෑමට සාපේක්ෂව 2022 තෙවන කාර්තුවේදී දී සියයට 39.3 කින් වර්ධනය වී ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) වාර්තා අනුව 2021 තෙවන කාර්තුවේදී දී විදේශිය සංචාරකයන් 21,016 පැමිණ තිබූ අතර එය 2022 තෙවන කාර්තුවේදී දී 114,855 ලෙස වාර්තා වී ඇත. ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි වී ඇති ලැයිස්තුගත හෝටල් සමාගම්වල කාර්තුමය මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 තෙවන කාර්තුව තුළ කාර්තුමය පිරිවැටුම 2021 තෙවන කාර්තුවේ කාර්තුමය පිරිවැටුම හා සසඳන විට සියයට 147.9 කින් වැඩි වී ඇත.

"වැඩසටහන් සකස් කිරීම, විකාශන කාර්යයන්, ශබ්ද පටිගත කිරීම හා වීඩියෝ නිෂ්පාදනය කිරීම" යන සේවා ආර්ථික කාර්යය සියයට 8.8 සෘණ වර්ධනයක් 2022 තුන්වන කාර්තුවේ වාර්තා කළේය. මෙම කර්මාන්තය තුළ වියදම්වල වැඩිවීමක් සහ ආදායමේ සුළු වැඩිවීමක් පමණක් පසුගිය කාර්තු දෙක තුළ දක්නට ලැබුණු අතර එය එකතු කළ දළ අගයෙහි අඩු වීමට හේතු විය..

2021 වර්ෂයේ තෙවන කාර්තුවේ "විදුලි සංදේශ සේවා සැපයීම" උප ආර්ථික කටයුත්ත සියයට 18.8 ක ඉහල ආර්ථික වර්ධනයක් වාර්තා කරන ලද අතර 2022 වර්ෂයේ තෙවන කාර්තුවේදී තවදුරටත් සියයට 3.3 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. පසුගිය වසර දෙක පුරාම මෙම ආර්ථික කටයුත්ත ඉහළ වර්ධන වේගයන් වාර්තා කර ඇත්තේ කෝවිඩ් - 19 වසංගතයේ බලපෑම හේතුවෙනි. නමුත් එහි බලපෑම අවම තත්ත්වයක් මෙම කාර්තුවේදී දැක ගත හැක. 2022 වර්ෂයේ තෙවන කාර්තුවේදී රැහැන් රහිත ස්ථාවර දුරකථන සම්බන්ධතා සියයට 1.2 කින් වැඩි වී ඇති අතර ජංගම දුරකථන සම්බන්ධතා සියයට 0.6 ක අඩුවීමක් වාර්තා කර ඇත. තවද අන්තර්ජාලය සහ ඊ - තැපැල භාවිතා කරන සම්බන්ධතා ප්‍රමාණය 2022 වර්ෂයේ තෙවන කාර්තුවේදී සියයට 6.1 කින් වැඩිවී ඇත.

දළ දේශීය නිෂ්පාදිතයට සියයට 1.8 ක දායකත්වයක් සපයන තොරතුරු තාක්‍ෂණය (IT) සහ තොරතුරු තාක්‍ෂණය සම්බන්ධ සේවා (ITES) ඇතුළු "පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා සම්බන්ධ කාර්යයන්", 2021 වර්ෂයේ තෙවන කාර්තුව හා සසඳන විට මෙම වසරේ තෙවන කාර්තුවේදී සියයට 4.7 ක හැකිලීමක් වාර්තා කර ඇත. විදුලිය ඇණහිටීම, ඉන්ධන හිඟය, විදේශ විනිමය රෙගුලාසි සහ අවිනිශ්චිත මෙහෙයුම් පරිසරය මෙම පසුබෑමට හේතු වී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන වාර්තා අනුව 2021 වසරේ තෙවන කාර්තුව හා සසඳන විට 2022 වසරේ තෙවන කාර්තුවේ දී පරිගණක සේවාවලින් උපයන ලද අපනයන ආදායමේ වටිනාකම රු. මිලියන 58,582 සිට රු. මිලියන 96,723 දක්වා වැඩි වී ඇත. එයට බොහෝ දුරට හේතු වී ඇත්තේ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල දැඩි ලෙස අවප්‍රමාණය වීමයි. කෙසේ වෙතත්, 2021 වර්ෂයේ තෙවන කාර්තුව හා සසඳන විට 2022 වර්ෂයේ තෙවන කාර්තුව තුළදී එක්සත් ජනපද ඩොලරයේ අගයෙන් පරිගණක සේවා අපනයන ආදායම ඩොලර් මිලියන 292 සිට ඩොලර් මිලියන 268 දක්වා සියයට 8.3 කින් අඩු වී ඇත.

'මූල්‍ය සේවා සැපයීම" ආර්ථික කටයුත්ත සඳහා බලපත්‍රලත් වාණිජ බැංකු (එල්සීබී), බලපත්‍රලත් විශේෂිත බැංකු (එල්එස්බී), වෙනත් ලියාපදිංචි මූල්‍ය සමාගම්, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් හුවමාරුව (සීඑස්ඊ) සහ ශ්‍රී ලංකාවේ ගෘහ නියෝජනය කරන පුද්ගලයින් විසින් සපයනු ලබන මූල්‍ය ආයතන විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන්හි දත්ත උපයෝගී කර ගනී. මෙම ආර්ථික කටයුත්ත 2021 තුන්වන කාර්තුවට සාපේක්ෂව 2022 තුන්වන කාර්තුවේ සියයට 31.1 ක සෘණාත්මක වර්ධනයක් වාර්තා වේ. මෙම කාර්තුවේදී ස්ථාවර මිල ගණන් යටතේ එකතුකළ අගය රුපියල් මිලියන 106,266 ක් වූ අතර එය 2021 තුන්වන කාර්තුවේ වාර්තා වූ රුපියල් මිලියන 154,228 ට වඩා පහළ අගයක් ගනී. මූල්‍ය සේවාවන්හි භාවිතාව, ණය හා අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම මගින් පෙන්නුම් කරයි. ඒ අනුව ණය අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම 2022 තුන්වන කාර්තුවේ පිළිවෙලින් සියයට 6.88 කින් සහ 17.85කින්

වර්ධනය වී ඇත. 2022 තුන්වන කාර්තුවේ "හරිත සාමාන්‍ය ණය පොලී අනුපාතය" සහ "හරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය" පිලිවෙලින් සියයට 17.58 ක් සහ සියයට 11.63ක් ලෙස සටහන් විය.

"රක්ෂණ සේවා සැපයීම සහ විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණය කිරීමේ" කටයුතු වල මූර්ත එකතුකළ අගය 2022 තෙවන කාර්තුවේදී සියයට 32.8 ක පසුබැස්මක් වාර්තා කර ඇති අතර පසුගිය වසරේ තෙවන කාර්තුවේ දී සියයට 2.7 ක පසුබැස්මක් වාර්තා කර ඇත. මෙම කාලයේදී රක්ෂණ සමාගම් වල සේවක ගෙවීම් සහ බදු පෙර ලාභයෙහි සියයට 36.5ක වර්ධනයක් වාර්තා කර ඇත. රක්ෂණ සේවාව භාවිතය මැන දක්වන උපයන ලද රක්ෂණ වාරික වටිනාකම හා උපයන ලද හිමිකම් වටිනාකමෙහි එකතුව මෙම කාර්තුවේ දී සියයට 14.0 කින් වර්ධනය වී ඇත. එමෙන්ම මෙම කාර්තුවේදී ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (NCPI) අගය සියයට 70.2 කින් වර්ධනයවී ඇත.

"දේපළ වෙළඳාම් කාර්යයන් (නිවාස අයිතිය ඇතුළත්)" 2021 තෙවන කාර්තුවට සාපේක්ෂව 2022 තෙවන කාර්තුවේදී සියයට 4.8 ක ඍණ වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම ආර්ථික කටයුත්තේ ස්ථාවර මිළ යටතේ එකතු කළ අගය රුපියල් මිලියන 156,286 ක් වන අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.9 ක දායකත්වයක් මෙම ආර්ථික කටයුත්ත මගින් ලැබේ.

වෘත්තීය සේවා උප ආර්ථික කටයුත්ත 2022 වර්ෂයේ තෙවන කාර්තුවේදී ස්ථාවර මිළ ගණන් යටතේ රුපියල් මිලියන 71,479 ක් වාර්තා කර ඇති අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 2.2ක පමණ දායකත්වයක් ලබාදී ඇත. මෙම ආර්ථික කටයුත්තෙහි එකතුකළ අගය ගණනය කරනු ලබන්නේ ආර්ථික ක්‍රියාකාරකම් 8ක එකතුවක් ලෙසිනි. මෙය ප්‍රධාන වශයෙන් "නීති හා ගිණුම් කාර්යයන්", "ගෘහ නිර්මාණ හා ඉංජිනේරු කාර්යයන්", "විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්", "ප්‍රචාරණ හා අලෙවි පර්යේෂණ, වෙනත් වෘත්තීය, විද්‍යාත්මක හා තාක්ෂණ කාර්යයන් සහ ප්‍රකාශන කාර්යයන්", "පශුවෛද්‍ය කාර්යයන්", "කුලී හා බදු කාර්යයන", "රැකියා, රැකියා නියෝජිත ආයතන, ආරක්ෂක හා විමර්ශන කාර්යයන්" සහ "ගොඩනැගිලි හා උද්‍යාන සැකසීම සම්බන්ධ සේවා සැපයීම් කාර්යයන්" ගෙන් සමන්විත වේ. මෙම කාර්තුව තුලදී මෙම ආර්ථික කටයුතු නිමැවුම් අගය ගණනය කරනු ලබන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන වැට් දත්ත වලට අනුව වේ. වෘත්තීය සේවා 2021 තුන්වන කාර්තුවට සාපේක්ෂව 2022 තෙවන කාර්තුවේ දී සියයට 7.0 ක පහළ යාමක් වාර්තා කොට ඇත.

කොවිඩ්-19 ආශ්‍රිත සෞඛ්‍ය සේවාවන්හි ව්‍යාප්තිය හේතුවෙන්, 2021 වසරේ බොහෝ කාර්තුවලදී මානව සෞඛ්‍ය සේවා සැලකිය යුතු ඉහළ ධනාත්මක වර්ධන වේගයක් වාර්තා කළේය. නමුත්, 2021 වසරේ තෙවන කාර්තුව හා සසඳන විට, 2022 තෙවන කාර්තුව තුළ, මානව සෞඛ්‍ය ක්‍රියාකාරකම් සියයට 7.5ක පසුබැසීමක් වාර්තා කර ඇත. 'කොළඹ කොටස් වෙළඳපොලේ' ලියාපදිංචි කර ඇති දිවයිනේ ප්‍රධාන රෝහල් හයක ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනයන්ගේ තෙවන කාර්තුවේ (ජූලි සිට සැප්තැම්බර් දක්වා) දත්ත අනුව, එම රෝහල්වල කාර්තුමය පිරිවැටුම 2021 වසරේ තෙවන කාර්තුවේ මූල්‍ය ප්‍රකාශන (ජූලි සිට සැප්තැම්බර් දක්වා) දත්ත හා සසඳන විට සියයට 6.4කින් පහළ ගොස් ඇත. එමෙන්ම, මෙම කාර්තුව තුළදී ඊ චැනලින් සේවාවන් සියයට 2.5ක සුළු වැඩි වීමක් පෙන්නුම් කර ඇත.

වර්තන මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයට සියයට 7.7 ක දායකත්වයක් සපයන "අනෙකුත් පුද්ගලික සේවා ක්‍රියාකාරකම්"යන ආර්ථික කටයුත්ත "කලා සහ පොදු විනෝදාස්වාදය", "වෙනත් පුද්ගලික ක්‍රියාකාරකම්" සහ " සේවායෝජකයන් ලෙස ඇති ගෘහ ඒකක වල කටයුතු" යන ආර්ථික ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ. 2021 තෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දි භාණ්ඩ ආනයනය සීමාකර තිබීම නිසා අමුද්‍රව්‍ය හිගවීම හා මිල ඉහල යාම විශාල වශයෙන් බලපෑම් සිදුකල අතර, විදුලි බලය දෛනිකව පැය කිහිපයක් කප්පාදු කිරීම හා ඉන්ධන අර්බුදය වැනි හේතුන් නිසා වාර්තා වන්නේ සියයට 1.4 ක් වැනි සුළු වර්ධනයකි.

| ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්ම | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර |
|---|---|
| දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම | ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම |


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සංඛ්‍යාන මන්දිරය

අංක.306/71,පොල්දූව පාර

බත්තරමුල්ල

info@statistics.gov.lk

+94 11 2147000

+94 11 2147011

statistics.gov.lk

මෙය ජාතික ගිණුම් අංශයේ ප්‍රකාශනයකි.

තෙවන මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

National.accounts@statistics.gov.lk

+9411 2147071 +94 112877938